# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1831/31 - 2013 ඔක්තෝබර් මස 12 වැනි සෙනසුරාදා - 2013.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 5/2011.

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

11 වැනි වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මා විසින්, ඉහත කී පනතේ 9 වැනි වගන්තිය යටතේ සාදනු ලැබූ සහ 2013 සැප්තැම්බර් මස 16 වැනි දින අංක 1828/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් "අධිවේගී මහා මාර්ගයක්" බවට ප්‍රකාශයට පත් කරන ලද කොළඹ - කටුනායක මහා මාර්ගයේ මේ නියමයේ උපලේඛනයේ දක්වා ඇති කොටස "ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක්" විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ,**
ජනාධිපති.

2013 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

*ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය සමන්විත වන ප්‍රදේශය*

කොළඹ - කටුනායක ජාතික මහා මාර්ගය ලෙස නම්කර ඇති අධිවේගී මහා මාර්ගයේ පැලියගොඩ (කි.මී. 1.820) සහ කටුනායක (කි.මී. 25.80) අතර පිහිටා ඇති කිලෝමීටර් 23.980 ක් දිගින් සහ මීටර් 60.00 ක් පළලින් යුතුව විහිදෙන මාර්ගයේ කොටස වේ.

10 - 840


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 1788 — 750 (2013/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*